# WEATHER FORECAST FOR 15th JULY 2019

**(Issued at 05.30 a.m. on 15th July 2019)**

**Prevailing Showery condition is expected to enhance to some extent over most parts of the island, particularly in south-western part during next few days (From 16th July).**

Showers or thundershowers at times will occur in Sabaragamuwa, Central, Western and North-Western provinces and in Galle and Matara districts. Showers or thundershowers will occur at several places elsewhere after 2.00 p.m. A few showers are likely in Jaffna district in the morning too.

Heavy falls about 100 mm are likely at some places in Western and Sabaragamuwa provinces and in Galle and Matara districts and fairly heavy falls above 50 mm can be expected at some places in Uva and Eastern provinces.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

දිවයිනේ දැනට පවතින වැසි සහිත කාලගුණ තත්ත්වයේ තරමක වැඩිවීමක් ඉදිරි දිනවලදී(ජූලි මස 16 වන දා සිට), විශේෂයෙන් නිරිත දිග කොටසේ පවතිනු ඇතැයි බලාපොරොත්තුවේ.

සබරගමුව, මධ්‍යම, බස්නාහිර සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

දිවයිනේ සෙසු ප්‍රදේශ වල තැනින් තැන සවස 2.00න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

යාපනය දිස්ත්‍රික්කයේ උදෑසන කාලයේදීත් වැසි ස්වල්පයක් ඇති විය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. 100 ක පමණ තද වර්ෂාපතනයන් ඇති විය හැකි අතර ඌව සහ නැගෙනහිර පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී. 50 ට වැඩි තරමක තද වර්ෂාපතනයන්ද අපේක්ෂා කලහැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 15th July 2019)

Showers or thundershowers will occur at several places in the sea area off the coast extending from Puttalam to Hambanthota via Colombo and Galle. Showers or thundershowers may occur at a few places in the other sea areas around the island in the evening or night.

Winds will be South-westerly and speed will be (25-35) kmph in the sea areas around the island.

Wind speed in the sea area off the coast extending from Hambantota to Batticaloa via Pottuvil and the sea areas off the coast extending from Puttalam to Kankasanturai via Mannar will be fairly rough at times as the wind speed can increase up to (40-50) kmph at times.

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය 2019 ජූලි මස 15 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා සෙසු මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේදී ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

දිවයින වටා මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. (25-35) පමණ වේ.

හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකළපුව දක්වා සහ පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (40-50) දක්වා වැඩි විය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019-07-15
Time : 0540 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE